**බෙන්තොට ප්‍රාදේශීය සභාව -2023**
**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

බෙන්තොට ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක් වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට බෙන්තොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය සඳහා වියදම් ණයහිමි ප්‍රතිපාදන රු.119,506 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි. | ඉදිරියේ දී නිවැරදි කරන බව | නිවැරදි ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) ප්‍රධාන කාර්යාලය නවීකරණය කිරීමේ රැඳවුම් මුදල් බේරුම් කර තිබුණ ද, එය ඉවත් නොකිරීම නිසා ගෙවිය යුතු තැන්පතු ශේෂය රු.523,738 ක් වැඩියෙන් දැක් වුණි. | -එම- | -එම- |
| (ඇ) ඇලකන්ද ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීමේ කර්මාන්තය සඳහා ණයහිමි ප්‍රතිපාදන රු.500,000 ක් හා වැටුප් රහිත නිවාඩු සඳහා ණයගැති ප්‍රතිපාදන රු.118,000 ක් වැඩියෙන් සලස්වා තිබුණු අතර, පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් දායක මුදලට ගෙවිය යුතු රු.5,049,029 ක ශේෂය වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | -එම- | -එම- |
| (ඈ) උපකරණ මිලදී ගැනීම සඳහා දරා තිබුණු රු.674,434 ක වටිනාකම ස්ථාවර වත්කම් යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඉ) වැඩියෙන් ප්‍රතිපූරණය වූ රු.361,623 ක ස්ථිර කාර්ය මණ්ඩලයේ වැටුප ගෙවිය යුතු ශේෂයක් ලෙස ගිණුම් ගතකර නොතිබුණි. | -එම- | -එම- |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 122 වගන්තිය සහ 126 වගන්තියෙහි (vii) (ඌ) උප වගන්තිය | සභා බල ප්‍රදේශය තුළ පවත්නා ත්‍රී රෝද රථ ගාල් සඳහා අතුරු ව්‍යවස්ථා පනවාගෙන ආදායම් අය කිරීමට කටයුතු කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථාව සඳහා අනුමැතිය ලද පසු ඉදිරි කටයුතු සිදු කරන බව. | අතුරු ව්‍යවස්ථා පනවාගෙන ආදායම් අය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 104 | බැකෝ යන්ත්‍රයේ පැති වීදුරුව බිඳී ගොස් තිබුණු අතර, ඒ සඳහා සිදු වී තිබුණු රු.164,150 ක පාඩුව සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | කටයුතු කරමින් පවතින බව. | වාහන අනතුර සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.7.2 අධිකාරි බලය නොලත් ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිනකට නිවස හා කාර්යාලය අතර ගමන් වාර 04 ක් සඳහා ලේකම්වරයා විසින් කණ්ඩායම් ප්‍රවාහනය රහිතව සභාවේ වාහනය භාවිතා කර තිබුණු අතර ඉන්ධන වෙනුවෙන් ඒ සඳහා රු.360,875 ක් ගෙවීම් කර තිබුණි. | ගමන්වාර සංඛ්‍යාව වාර 4 සිට වාර 2 දක්වා අඩු කර ඇති බව. | පිරිවැය අවම වන පරිදි කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.13,768,077 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,950,422 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 25,928,600 | 28,169,572 | 37,873,446 | 18,604,712 | 24,930,030 | 27,281,887 | 20,839,434 | 28,308,586 |
| කුලී | 2,699,100 | 2,658,350 | 2,624,050 | 49,000 | 1,854,000 | 1,249,853 | 1,337,355 | 14,700 |
| බලපත්‍ර ගාස්තු | 643,150 | 967,645 | 980,502 | 77,388 | 885,400 | 621,766 | 636,171 | 90,245 |
| වෙනත් ආදායම් | 9,213,710 | 15,739,523 | 16,973,640 | 30,061 | 7,399,100 | 6,970,944 | 6,023,539 | 1,264,178 |
| | 38,484,560 | 47,535,090 | 58,451,638 | 18,761,161 | 35,068,530 | 36,124,450 | 28,836,499 | 29,677,709 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ වරිපනම් බදු ආදායම රු.28,308,586 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ ශේෂය රු.18,604,712 ක් විය. ප්‍රධාන කාර්යාලයට අයත් සභා බල ප්‍රදේශය තුළ පැවති වරිපනම් ඒකක 6501 කින් රු.2,182,037 ක වටිනාකමැති ඒකක 924 ක් වසර 10 කට වඩා වැඩි කාලයක සිට බදු ගෙවීම පැහැර හැර තිබුණි. ඉඳුරුව උප කාර්යාලයට අයත් බදු ඒකක 446 කින් ඒකක 26 ක රු.10,000 ට වඩා වැඩි අයවීමට තිබූ හිඟ ශේෂයන්ගේ එකතුව රු.5,701,292 ක් විය. | හිඟ වරිපනම් අයකර ගැනීමට අදාළව ඉදිරි කටයුතු සිදු කරන බව. | හිඟ වරිපනම් හා බදු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සභා පනතේ 159(2) ප්‍රකාරව කසළ බදු අය කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවාගෙන නොතිබුණු අතර, බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යන ආයතන 14 කින් පමණක් රු.448,000 ක් කසළ බදු ලෙස අය කරගෙන තිබුණි. බල ප්‍රදේශය තුළ හඳුනාගෙන තිබූ ආපන ශාලා සහ ලැගුම්හල් 238 කින් කසළ බදු අයකිරීම සඳහා නිශ්චිත ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | කසළ බදු නොගෙවන ආයතන හඳුනාගෙන ඇති බව. | කසළ බදු ආදායම් අයකර කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සභා බල ප්‍රදේශයේ ප්‍රදර්ශනය කර තිබූ දැන්වීම් පුවරු 70 ක් වෙනුවෙන් අයවිය යුතු රු.241,230 ක ගාස්තුවක් අයකර ගෙන නොතිබුණි. | ගාස්තු නොගෙවා ඇති දැන්වීම් පුවරුවක් සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | හිඟ දැන්වීම් පුවරු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල් 06 ක් 2017 වර්ෂයේ සිට සියයට 1ක බලපත්‍ර ගාස්තුව ගෙවා නොතිබුණි. | 0.5% දක්වා අඩු කිරීමේ යෝජනාවට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව හා ගෙවා නොමැති ආයතන සඳහා 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා අධිකරණයේ නඩු තීන්දුව මත අයකර ගැනීමට නියමිත බව. | උපරිම ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඉ) පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු රු.80,000 ක් හා උසාවි දඩ රු.31,110,878 ක් විය. | මුද්දර ගාස්තු හා උසාවි දඩ එම වර්ෂයේ දීම නොලැබෙන බැවින් වර්ෂයට අදාළව ඇස්තමේන්තු අගයක් මත ගිණුම් පිළියෙල කරනු ලබන බව. | හිඟ ආදායම් අය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පිරිවැය රු.5,280,681 ක් වූ JCB රථය වසර 05 ක කාලයක සිට බෙන්තොට සභා වැඩ ඒකක භූමියේ පරිසරයට නිරාවරණය වන පරිදි නිශ්කාර්යව ගාල් කර තිබෙන අතර, මෙය අළුත්වැඩියා කර භාවිතා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | යාන්ත්‍රික ඉංජිනේරුගේ පරීක්ෂණ වාර්තාව ප්‍රකාරව ඉදිරි කටයුතු සිදු කරනු ලබන බව. | අළුත්වැඩියා කර භාවිතයට ගැනීම හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) ලියාපදිංචි අංකය හඳුනාගත නොහැකිව දිරා ගිය ට්‍රැක්ටර් ට්‍රේලරයක අබලි කොටස් සහ 2020 වර්ෂයේ අපහරණය කිරීමට අනුමත වී තිබුණු හයිඩෝ කැබ් රථයක් අපහරණය කර නොතිබුණි. | පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලද පසු ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිත බව. | අපහරණ කටයුතු කඩිනමින් අවසන් කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ අංක 4/04/01/2021 ප්‍රකාරව පොල බදු එකතු කිරීම සඳහා දේපල තහනම් කිරීමේ නිලධාරියෙකු පත්කර තිබුණ ද චක්‍රලේඛය ප්‍රකාරව හිඟ මුදලින් සියයට 75 ක් අයවී ඇත්නම් කොමිස් සියයට 12 ක් ගෙවිය හැකි වුවත් ඊට පටහැනිව ආදායම් එකතු කිරීමේ ප්‍රතිශතය සියයට 1 ත් සියයට 11 ත් අතර පැවතිය දී සභාව විසින් කොමිස් වශයෙන් අදාළ නිලධාරියා වෙත රු.530,421 ක් ගෙවා තිබුණි. | ඉදිරියේ දී අදාළ චක්‍රලේඛය අනුව පමණක් ගෙවීම් සිදු කරන බව දන්වා සිටිමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු අක්කර 12 රූඩ් 25 පර්චස් 25 ක් වූ ඉඩම් කැබලි 48 ක වටිනාකම තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි. | තක්සේරු කිරීමට නියමිත බව. | වටිනාකම තක්සේරු කළ යුතුය. |
| (ආ) | සභාව සතු අක්කර 03 රූඩ් 17 පර්චස් 04 ක් වූ ඉඩම් කැබලි 18 ක් හිස් ඉඩම් ලෙස පැවති අතර, ඒවා ඵලදායී කටයුතු සඳහා යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි | ඉදිරියේ දී විවිධ බෝග වගා කිරීමේ කටයුතු සඳහා යොදා ගැනීමට නියමිත බව. | සභාව සතු වත්කම් ඵලදායීව යොදා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හිපන්වත්ත මහජන ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීමේ දී වැඩ විෂය අංක 2.1, 3.1, 3.2 හා 3.3 යටතේ පිළිවෙලින් යන්ත්‍ර භාවිතා කර පස් කැපීම, පැති බැම්ම අත්තිවාරම් කැපීම, ඒ සඳහා කොන්ක්‍රීට් කිරීම සහ ප්ලම් කොන්ක්‍රීට් කිරීම ආදිය සඳහා නියමිත මිල අනුපාත භාවිතා නොකිරීම හේතුවෙන් ඉහත වැඩ විෂයයන් සඳහා පිළිවෙලින් රු.673,873 ක්, රු.158,949 ක්, රු.56,734 ක් හා රු.203,741 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. | පස් කැපීම EW 16 භාවිතා කර ඇස්තමේන්තු පිළියෙල කරන ලද බව, අත්තිවාරම් කැපීම මිනිස් ශ්‍රමයෙන් සිදු කරන ලද බව හා කොන්ක්‍රීට් කිරීම සහ ct–35 මිල අනුපාත භාවිතා කරන ලද බව. | නියමිත මිල අනුපාත භාවිතා කළ යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ සේවය කර සේවය අත්හැර හා විශ්‍රාම ගිය නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයවිය යුතු රු.88,409 ක ණය ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරන බව. | අයවිය යුතු හිඟ සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |